HIV/AIDS පිළිබඳව වාර්තා කිරීමේදී මාධ්‍ය මගින් සිදුකරනා සුලභ වරදක් ලෙස මෙම එච්.අයි.වී සහ ඒඩ්ස් යන යෙදුම් දෙක පටලවා ගැනීම පෙන්වා දිය හැක. එච්.අයි.වී. (Human Immunodeficiency Virus) නොහොත් 'මානව ප්‍රතිශක්ති ඌනතා වෛරසය' ආසාදනය වීම නිසා මිනිසුන්ට ඒඩ්ස් (Acquired Immune Deficiency Syndrome) තත්වය ඇතිවිය හැක. වෙනත් ලෙසකින් පවසන්නේ නම්, HIV යනු වෛරසය වන අතර, AIDS යනු පෙර කී වෛරසය මඟින් ප්‍රතිශක්තිය දුර්වල කිරීම නිසා ඇති වන තත්වය ලෙසින් හඳුනාගත හැක. එනම්, ඒඩ්ස් ආසාදනය නොවන අතර, ආසාදනය වන්නේ එච්.අයි.වී. වෛරසයයි.
මෙම වරදවා වටහා ගැනීම සහ ඒ ඔස්සේ ඇතැම් මාධ්‍ය වැරදි තොරතුරු සමාජයට ලබාදීමට උදාහරණයක් ලෙසින් පහත දිවයින පුවත (12/01) ගත හැක. මෙය ලියූ මාධ්‍යවේදියා පැහැදිලිවම එච්.අයි.වී. සහ ඒඩ්ස් යන දෙක සම්බන්ධයෙන් අපැහැදිලිව සිටිනා බව පෙනී යයි. එසේම පහත දැක්වෙන අරුණ පුවත (12/01) නිවැරදි ආකාරයෙන් එච්.අයි.වී. යන යෙදුම පමණක් යොදාගෙන තිබේ.
HIV/AIDS පිළිබඳව වාර්තාකරණයේදී දුර්මත ඉදිරිපත් නොකිරීම, වැරදි හෝ නොමඟ යවන සුළු තොරතුරු ලබානොදීම පිළිපැදිය යුතු මාධ්‍ය ආචාර ධර්මයක් ලෙසින් දැක්වේ. ඒ අනුව ගත් විට, දිවයින පුවත නොදැනුවත් බව නිසා හෝ ආචාර ධාර්මික නොවන වාර්තාකරණයක් සිදුකර තිබේ.
HIV/AIDS පිළිබඳව වාර්තා කිරීම වැනි කරුණු වලදී මෙම ආචාර ධර්මයන් පිළිපැදීමත්, නිවැරදි තොරතුරු ලබාදීමත්, සමාජය තුළ HIV/AIDS සම්බන්ධයෙන් දුර්මත අවම කිරීම සඳහා මාධ්‍යයට ලබාදිය හැකි දායකත්වයයි. එය මාධ්‍යයේ සමාජ වගකීමයි.
#MediaEthicsSL #lka #SinhalaPress #Aruna #Divaina